**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සභාව විසින් වෙළඳ කුටි 07 ක් ඉදිකිරීම සඳහා රු.400,000 ක් වැයකර තිබුණ ද, එම වියදම රු.84,000 ක් ලෙස ස්ථාවර වත්කම් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.35,271,561 ක් වියදම් කර තිබුණ ද, ස්ථාවර වත්කම්වල ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.6,983,152 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේදී සභාව වෙත ලබා දී තිබූ වාහන 05 ක වටිනාකම රු.59,719,729 ක් වුවද, ගිණුම්වල රු.26,000,000 ක් වශයෙන් දක්වා තිබුණු බැවින් වාහනවල වටිනාකම රු.33,719,729 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් නව කඩ කාමර 49 ක් ඉදිකිරීම සඳහා බදුකරුවන්ගෙන් ලබාගත් ඇප තැන්පත් මුදල වන රු.7,350,000 ක් තැන්පත් ගිණුමේ ගිණුම්ගත නොකිරීම නිසා ශේෂ පත්‍රයේ තැන්පතු වටිනාකම ඉහත වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ ශේෂය රු.213,792 ක් වුවද, ශේෂ පත්‍රයේ හිඟ උසාවි දඩ ශේෂය ලෙස රු.80,292 ක් දැක්වීම තුලින් හිඟ උසාවි දඩ ශේෂය රු.133,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | ප්‍රදේශීය සභා රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන් තිදෙනා විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 (03.01) | සභාව සතු වාහන 17 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව මාස 06 කට වරක් සිදුකර නොතිබුණි. |

**2.**

**මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,095,504 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,265,047 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.169,543 ක පසුබෑමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පුනරාවර්තන ආදායම් විග්‍රහයේදී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කුලී ආදායම්, බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු, යන ආදායම් මූලාශ්‍ර සියයට 13 සිට සියයට 30 දක්වා පරාසයක වර්ධනයක් ද, වරිපනම් හා බදු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා අධාර යන මූලාශ්‍රවල සියයට 03 සිට සියයට 22 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

පුනරාවර්තන වියදම් විග්‍රහයේ දී ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වල සියයට 04 ක වර්ධනයක් ද ගමන් වියදම්, සැපයුම් උපකරණ, ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව, ප්‍රවාහන හා විශ්‍රාම වැටුප් යන මූලාශ්‍රවල සියයට 06 සිට සියයට 50 දක්වා පරාසයක අඩුවීමක් ද පෙන්නුම් කරයි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් | 2016 වර්ෂයේ තථ්‍ය ආදායම් | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ----------------- | --------------------- | ---------------- | ------------------------ |
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,578,956 | 1,623,639 | 1,783,805 |
| කුලී | 5,926,450 | 5,835,636 | 30,855 |
| බලපත්‍ර ගාස්තු | 1,346,500 | 1,565,378 | 78,450 |
| සේවා සඳහා ගාස්තු | 765,000 | 527,055 | - |
| වරෙන්තු හා දඩ | 1,253,000 | 892,480 | 80,292 |
| වෙනත් ආදායම් | 390,000 | 323,523 | - |

**2.3.2 වරිපනම් හා බදු**

**----------------**

සභාව විසින් අවසන් වරට වරිපනම් තක්සේරුව සිදු කර ඇත්තේ 2011 වර්ෂයේ වන අතර, එම වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයටද වරිපනම් අයකිරීම සිදුකර තිබුණි.

වරිපනම් ලේඛනය අනුව 2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් වටිනාකම රු.1,783,805 ක් වූ අතර, එම මුදල් අයකර ගැනීම සඳහා සභාව ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

**2.3.3 මුද්දර ගාස්තු**

**------------**

රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් මුද්දර ගාස්තු වශයෙන් රු.46,000 ක් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් සභාව වෙත ලබාදී තිබුණු කැබ් රථයේ ලියාපදිංචිය නියමිත දිනයේදී සිදුකර නොගැනීම නිසා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දඩ මුදල් වශයෙන් රු.155,650 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) සභාවට අයත් වාහන 05 ක් සඳහා ආදායම් බලපත්‍ර නියමිත දිනට ලබා නොගැනීම නිසා රු.11,600 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) මහවැලි අධිකාරිය, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, නැගෙනහිර පළාත් පාලන රාජ්‍ය නොවන සංවිධානය මගින් ලබාදී තිබූ වාහන 04 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1998 වර්ෂයේදී සභාව විසින් සඳුන්පුර ග්‍රාමෝදය මණ්ඩලය වෙත හා නාමල්ඔය ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ රු.40,000 ක අත්තිකාරම් මුදල පියවා ගැනීමට 2017 ජූනි 05 දින වනතුරු කටයුතු කර නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

ප්‍රාදේශීය සභාව සතු කැබ් රථ 02 ක්, රෝද හතරේ ට්‍රැක්ටරයක් හා ට්‍රැක්ටර් ටේලර් 02 ක්, වර්ෂ 05 සිට 07 දක්වා අතර කාලයක නිශ්ක්‍රීයව පැවතුන අතර, මෙයින් අලුත්වැඩියා කළ හැකි වාහන අලුත්වැඩියා කර පරිහරණයට ගැනීමට හා භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම සහ තථ්‍ය වියදම අතර සියයට 07 සිට සියයට 171 ක පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2016 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පද්ධතිය | | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත කිරීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර ගැනීම<br>ii. අතුරු ව්‍යවස්ථා පැනවීම<br>iii. ආදායම් ප්‍රභව හඳුනාගැනීම |
| (ඇ) | අයවැය පාලනය | - | අයවැය ඇස්තමේන්තු ඉටුකර ගැනීම. |
| (ඈ) | ගබඩා පරිපාලනය | - | ක්ෂණිකව හරි වැරදි බැලිය හැකි ආකාරයට භාණ්ඩ ගබඩා කිරීම |
| (ඉ) | වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා ගැනීම |